සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2024 ජූලි

## (101) මූල්‍ය ගිණුම්කරණය

(Financial Accounting)

2024-08-17
පෙරවරු
[09.00 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  (1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*
  (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  (3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*
  (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  (6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  (7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** අස්තිත්වයක සියලු වගකීම් අඩුකිරීමෙන් පසු වත්කම්වල ඉතිරි වන හිමිකම වන්නේ:

(1) ආදායමයි. (2) ස්කන්ධයයි. (3) වියදමයි. (4) මුදල් ය.

**1.2** "මෑතකදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් 2024 අංක 09 දරණ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත (Online Safety Act) සම්මත කරන ලදී".

පහත සඳහන් පාරිසරික සාධක අතුරෙන්, ඉහත ප්‍රකාශය නියෝජනය වන්නේ කුමන සාධකයේ ද?

(1) ආර්ථික පරිසරය. (2) නෛතික පරිසරය.
(3) තාක්ෂණික පරිසරය. (4) සමාජීය පරිසරය.

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, භාණ්ඩ ලැබෙන අවස්ථාවේදී, භාණ්ඩ ලැබුණු බව තහවුරු කරමින් ගබඩා භාරකරු විසින් නිකුත් කරනු ලබන නිවැරදි මූලාශ්‍ර ලියවිල්ල තෝරන්න:

(1) ගැනුම් ඇණවුම [Purchase Order (PO)].
(2) භාණ්ඩ ලැබීමේ පත්‍රය [Good Received Note (GRN)].
(3) ද්‍රව්‍ය අධියාචනා පත්‍රය [Material Requisition Note (MRN)].
(4) හර පත [Debit Note].

**1.4** පහත සඳහන් තොරතුරු, කේවලස්වාමි ව්‍යාපාරයක් වන **සිරි ට්‍රේඩර්ස්** හි පොත්වලින් 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා උපුටාගන්නා ලදී:

| | **රු.** |
|---|---|
| 2024 මාර්තු 31 දිනට මුළු වත්කම් | 4,800,000 |
| 2024 මාර්තු 31 දිනට වගකීම් | 750,000 |
| 2023 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | 2,000,000 |
| වර්ෂය තුළදී සිදුකළ ගැනිලි | 400,000 |
| වර්ෂය තුළදී යොදවන ලද අමතර ප්‍රාග්ධනය | 800,000 |

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභය වූයේ:

(1) රු.1,650,000/-. (2) රු.2,050,000/-. (3) රු.2,450,000/-. (4) රු.1,800,000/-.

**1.5** ආපසු එවන ලද, ණයට විකුණන ලද භාණ්ඩ වාර්තා කිරීම සඳහා විකුණුම්කරු විසින් භාවිත කරනු ලබන මූලික සටහන් පොත වන්නේ:

(1) දෛනික ආපසු යැවුම් පොතයි. (2) දෛනික ආපසු එවුම් පොතයි.

(3) දෛනික ගැනුම් පොතයි. (4) දෛනික විකුණුම් පොතයි.

**1.6** **සැම් ට්‍රේඩර්ස්,** 2022 අප්‍රේල් 01 දින රු.4,000,000/- කට මෝටර් රථයක් මිලට ගත්තේය. ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ වාර්ෂිකව 20% අනුපාතයට හීනවන ශේෂ ක්‍රමයට ක්ෂය ප්‍රතිපාදනය කිරීමයි. 2024 මාර්තු 31 දිනට මෝටර් රථයේ ධාරණ අගය (ශුද්ධ පොත් අගය) [carrying value (Net Book Value)] වූයේ:

(1) රු.2,400,000/-. (2) රු.3,200,000/-. (3) රු.2,560,000/-. (4) රු.3,000,000/-.

**1.7** **කුසල්,** රු.2,000,000/- ක් වටිනා මෝටර් රථයක් සහ මුදලින් රු.500,000/- ක් යොදවමින්, ගෘහ භාණ්ඩ ව්‍යාපාරයක් (කේවලස්වාමි ව්‍යාපාරයක්) ආරම්භ කළේය. මෙම ගනුදෙනුවෙන් ගිණුම්කරණ සමීකරණයට වන නිවැරදි බලපෑම, පහත සඳහන් ඒවා අතුරෙන් තෝරන්න:

| | **වත්කම් (රු.)** | **=** | **ප්‍රාග්ධනය (ස්කන්ධය) (රු.)** | **+ වගකීම් (රු.)** |
|---|---|---|---|---|
| (1) | + 2,500,000 | = | + 2,500,000 | - |
| (2) | + 500,000 | = | + 500,000 | - |
| (3) | + 2,500,000 | = | - | + 2,500,000 |
| (4) | + 2,500,000 | = | + 500,000 | + 2,000,000 |

**1.8** ණයගැතියන්ගෙන් අඩමාන ණය සඳහා ප්‍රතිපාදනයක් කළ යුතුය. මීට අදාල වන ගිණුම්කරණ සංකල්පය වන්නේ:

(1) අස්තිත්ව (Entity) සංකල්පයයි. (2) ප්‍රමාණාත්මක බවේ (Materiality) සංකල්පයයි.

(3) ආරක්ෂණ (Prudence) සංකල්පයයි. (4) සංගතතා (Consistency) සංකල්පයයි.

**1.9** පහත සඳහන් ගනුදෙනු අතුරෙන්, පොදු ජර්නලයේ වාර්තා **නොකරන්නේ** කුමන ගනුදෙනුව ද?

(1) කාර්යාලයේ භාවිතය සඳහා අත්පිට මුදලට පරිගණකයක් මිලදී ගැනීම.

(2) ව්‍යාපාරයේ භාවිත කළ මෝටර් රථයක් ණයට විකිණීම.

(3) වැරැද්දක් නිවැරදි කිරීමේ සටහනක්.

(4) ආරම්භක ජර්නල් සටහන්.

**1.10** **සීමාසහිත රාත් සමාගම,** කර්මාන්තශාලා ගොඩනැගිල්ල සඳහා 2024 කැලැන්ඩර් (ලිත්) වර්ෂයේ රක්ෂණ වාරිකය වශයෙන් රු.120,000/- ක් ගෙවා තිබේ. ව්‍යාපාරයේ ගණකාධිකාරීවරයා විසින් රක්ෂණ වියදම් වශයෙන් රු.30,000/- ක්ද, ඉදිරියට ගෙවූ රක්ෂණ වශයෙන් ඉතිරි රු.90,000/- ද, 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වාර්තා කර තිබුණි.

මේ සම්බන්ධයෙන් අදාල වන ගිණුම්කරණ සංකල්පය වන්නේ:

(1) උපචිත සංකල්පය යි.

(2) අඛණ්ඩ පැවැත්ම සංකල්පයයි.

(3) අයභාරය හඳුනාගැනීමේ සංකල්පයයි.

(4) ගැලපුම් සංකල්පයයි.

*අංක 1.11 සිට 1.15 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.11** ආදායම් සහ වියදම්, ආදායම් ප්‍රකාශනයේ මූලිකාංග වේ.

**1.12** මාස 12 ක කාල පරිච්ඡේදයකින් පසුව පියවීමට අපේක්ෂා කරන වගකීම්, ජංගම වගකීම් යටතේ වර්ග කිරීමට පුළුවනි.

**1.13** අස්තිත්වයක් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, එහි වත්කම්, ජංගම සහ ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීම, අඛණ්ඩ පැවැත්ම සංකල්පය භාවිත කිරීමකි.

**1.14** රහස්‍යභාවය යනු මූල්‍ය තොරතුරුවල මූලික ගුණාත්මක ලක්ෂණයක් වේ.

**1.15** ව්‍යාපාරයක් විසින් නැවත විකිණීම සඳහා මිලදී ගත් පරිගණක, දේපළ, පිරියත සහ උපකරණ යටතේ වාර්තා කරයි.

*අංක 1.16 සිට 1.20 දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.16** ගිණුම්කරණ දෝෂ (වැරදි) සඳහා හේතු දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

**1.17** "වගකීමක්" යන පදය නිර්වචනය කරන්න.

**1.18** "විශේෂිත ගිණුම්කරණ මෘදුකාංග" යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

**1.19** අස්තිත්වයක් බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කරන්නේ ඇයිදැයි යන්නට හේතු දෙකක්(02) සඳහන් කරන්න.

**1.20** "මූල්‍ය මිනුම් සංකල්පය" කෙටියෙන් පැහැදිලි කරන්න. (එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

**රෝහිත්,** කේවලස්වාමි ව්‍යාපාරයක් වන **රෝහිත් හාඩ්වෙයාර්** 2023 අප්‍රේල් 01 දින මුදලින් රු.2,250,000/- ක් ආයෝජනය කරමින් ආරම්භ කරන ලදී.

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් පාලන ගිණුමේ (මුදල් පොතේ) සාරාංශය පහත දැක්වේ:

**මුදල් පාලන ගිණුම (මුදල් පොත)**

| ලැබීම් | හර (රු.) | ගෙවීම් | බැර (රු.) |
|---|---|---|---|
| මූලික ප්‍රාග්ධන ආයෝජනය | 2,250,000 | අත්පිට ගැනුම් | 850,000 |
| අත්පිට විකුණුම් | 5,200,000 | වෙළෙඳ ණයහිමියන්ට ගෙවීම් | 3,750,000 |
| වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 1,250,000 | වැටුප් සහ වේතන | 950,000 |
| | | ගැනිලි | 100,000 |
| | | සුළු මුදල්වලට මාරු කළ මුදල | 60,000 |
| | | යන්ත්‍රය (2024 ජනවාරි 01 දින මිලදී ගත්) | 1,000,000 |
| | | කාර්යාල කුලිය | 900,000 |
| | | විදුලිය | 150,000 |
| | | ශේෂය ප/ගෙ | 940,000 |
| | **8,700,000** | | **8,700,000** |

(2) 2024 මාර්තු 31 වන දිනට ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ පහත සඳහන් පරිදි විය:

| | රු. |
|---|---|
| වෙළෙඳ ණයගැතියෝ | 1,600,000 |
| වෙළෙඳ ණයහිමියෝ | 1,100,000 |
| ගෙවිය යුතු වැටුප් | 80,000 |

(3) යන්ත්‍ර, සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් ක්ෂය කළ යුතුය.

(4) පහත සඳහන් වියදම් සුළු මුදල්වලින් ගෙවා ඇත:

(i) ජල බිල්පත් : රු.12,000/-.

(ii) ලිපි ද්‍රව්‍ය : රු.8,000/-.

(iii) ගමන් වියදම් සහ ප්‍රවාහන : රු.25,000/-.

(5) 2024 අප්‍රේල් සිට 2024 ජූනි දක්වා කාලපරිච්ඡේදය සඳහා ගෙවන ලද රු.180,000/- ක කුලී අත්තිකාරමක්, කාර්යාල කුලී ගෙවීම තුළ ඇතුළත් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2024 මාර්තු 31 දිනට **රෝහිත් හාඩ්වෙයාර්** හි ශේෂ පිරික්සුම **පිළියෙළ කරන්න.** (ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

**රිශාද් ඇලුමිනියම්,** ඇලුමිනියම් පිරිසැකසුම් නිෂ්පාදකයෙකු වන අතර, පහත සඳහන් තොරතුරු 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **රිශාද් ඇලුමිනියම්** හි ගිණුම් පොත්වලින් උපුටාගන්නා ලදී:

| විස්තරය | රු. |
|---|---|
| 2023 අප්‍රේල් 01 දිනට අමුද්‍රව්‍ය තොගය | 380,000 |
| වර්ෂය තුළදී මිලට ගත් අමුද්‍රව්‍ය | 3,600,000 |
| 2023 අප්‍රේල් 01 දිනට නොනිමි වැඩ | - |
| අමුද්‍රව්‍ය ගෙනඒමේ කුලී | 55,000 |
| නිෂ්පාදන සේවකයින්ට ගෙවූ සෘජු වේතන | 1,800,000 |
| යන්ත්‍ර නඩත්තුව | 120,000 |
| ආරක්ෂක ගාස්තු | 450,000 |
| විදුලිය | 800,000 |
| කුලිය | 570,000 |
| ක්ෂය - පිරියත සහ යන්ත්‍ර | 120,000 |
| ක්ෂය - මෝටර් ලොරි රථය | 360,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2024 මාර්තු 31 දිනට අවසන් තොග ශේෂ පහත පරිදි අගය කර ඇත:

| විස්තරය | රු. |
|---|---|
| අමුද්‍රව්‍ය තොගය (පිරිවැයට) | 150,000 |
| නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කර ඇත) | 180,000 |

(2) පහත සඳහන් වියදම්, පහත දක්වා ඇති පරිදි බෙදා වෙන් කරනු ලැබේ:

| වියදම් | කර්මාන්තශාලාව | කාර්යාලය |
|---|---|---|
| විදුලිය | 75% | 25% |
| කුලිය | 70% | 30% |
| ආරක්ෂක ගාස්තු | 80% | 20% |

(3) පිරියත සහ යන්ත්‍ර, ඇලුමිනියම් පිරිසැකසුම් නිෂ්පාදනය සඳහා භාවිත කරන අතර, මෝටර් ලොරිය, නිෂ්පාදනය කරන ලද අයිතම, පාරිභෝගිකයින්ට බෙදාහැරීම සඳහා ව්‍යාපාරය විසින් භාවිත කරනු ලබයි.

(4) නිෂ්පාදනය කරන ලද අයිතම, නිෂ්පාදන පිරිවැය මත 15% ක ලාභයක් සහිතව වෙළෙඳ අංශයට මාරු කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා, **රිශාද් ඇලුමිනියම්** හි නිෂ්පාදන පිරිවැය ලේඛණය (නිෂ්පාදන ගිණුම) **පිළියෙල කරන්න.**

(ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

**පුබුදු ට්‍රේඩර්ස්** හි ගිණුම් විධායක විසින් 2024 මාර්තු 31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම, එකඟ නොවූ අතර, වෙනස වූ රු.27,000/- අවිනිශ්චිත ගිණුමට හර කරන ලදී.

වෙනස සඳහා පහත සඳහන් හේතු පසුව හඳුනාගන්නා ලදී:

(1) 2024 මාර්තු මාසය සඳහා රු.8,000/- ක අනියම් වැටුප් ගෙවීමක්, මුදල් පොතේ පමණක් සටහන් කර තිබුණි.

(2) රු.6,000/- ක බැංකු ණය පොලිය, මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබුණි. කෙසේවෙතත්, එය වැරදි ලෙස පොලී ආදායම් ගිණුමට බැර කර තිබුණි.

(3) 2023 ඔක්තෝම්බර් 01 දින, රු.80,000/- කට මිලට ගන්නා ලද මුද්‍රණ යන්ත්‍රයේ වටිනාකම, පරිගණක අළුත්වැඩියා ගිණුමට හර කර තිබුණි. නමුත්, මෙය නිවැරදිව මුදල් පොතේ සටහන් කර තිබේ. සරල මාර්ග ක්‍රමයට, පිරිවැය මත වාර්ෂිකව 10% බැගින් වන මුද්‍රණ යන්ත්‍රයේ අදාල ක්ෂය කිරීම ද ගිණුම් පොත්වල වාර්තා කර නොමැත.

(4) 2024 මාර්තු මාසය සඳහා රු.5,000/- ක උපචිත විදුලි බිලක් අදාල ගිණුම් පොත්වල දෙවරක් සටහන් කර ඇත.

(5) ණයගැතියන්ට දුන් රු.12,500/- ක වට්ටමක්, ලද වට්ටම් ගිණුමට බැර කර තිබුණි. නමුත් මෙය ණයගැති පාලන ගිණුමේ නිවැරදිව සටහන් කර තිබුණි.

(6) 2024 ජනවාරි මාසය සඳහා ගෙවන ලද රු.24,000/- ක කුලී වියදම, රු.42,000/- ක් ලෙස කුලී වියදම් ගිණුමේ සටහන් කර තිබුණි. නමුත්, එයට අදාල බැර සටහන නිවැරදිව සටහන් කර තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ඉහත සඳහන් වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්. (ලකුණු 07)

(b) අවිනිශ්චිත ගිණුම. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

(A) **වරුණි,** සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. පහත සඳහන් ගනුදෙනු 2024 ජනවාරි මාසය තුළදී සිදුව තිබුණි:

(1) නැවත විකිණීම සඳහා රු.250,000/- ක් වටිනා භාණ්ඩ, ණයට මිලදී ගැනීම.

(2) රු.150,000/- ක පිරිවැය වූ භාණ්ඩ රු.200,000/- කට අත්පිට මුදලට විකිණීම.

(3) ඉතිරිකිරීමේ ගිණුම සඳහා රු.2,000/- ක පොලී ආදායමක් ලැබීම.

(4) රු.6,000/- ක මාසික විදුලි බිල ගෙවීම.

(5) රු.5,000/- ක් වන පොලී මුදල ඇතුළත්ව රු.15,000/- ක බැංකු ණය මුදලේ වාරිකයක් ගෙවීම.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත සඳහන් එක් එක් ගනුදෙනුව මගින් පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම **සඳහන් කරන්න.**

*[තොගය + මුදල් = ස්කන්ධය (ප්‍රාග්ධනය) + වගකීම්]* (ලකුණු 05)

(B) 2024 ජනවාරි 31 දිනට, **අනුෂ්කා බියුටි සැලෝන්** හි බැංකු ප්‍රකාශනයේ රු.27,000/- ක වාසිදායක ශේෂයක් පෙන්වූ අතර, මුදල් පාලන ගිණුම රු.25,000/- ක හර (වාසිදායක) ශේෂයක් පෙන්විය.

පසුව, ව්‍යාපාරයේ ගිණුම් විධායක විසින් බැංකු ප්‍රකාශනයේ ශේෂය සහ මුදල් පාලන ගිණුමේ ශේෂය අතර, වෙනස සඳහා පහත සඳහන් හේතු සටහන් කරන ලදී:

(1) බැංකුවට දී ඇති ස්ථාවර නියෝගය අනුව, රු.15,000/- ක ණය වාරිකයක් බැංකුව විසින් හර කර තිබේ. නමුත්, මෙය මුදල් පොතේ සටහන් කර නොමැත.

(2) 2024 ජනවාරි 10 දින, බැංකුව විසින් බැංකු ගාස්තු ලෙස රු.500/- ක් හර කර තිබෙන අතර, එය මුදල් පොතේ සටහන් කර නොමැත.

(3) ස්ථාවර තැන්පතුවක් මත ලද රු.8,000/- ක පොලී ආදායම, බැංකුව විසින් බැංකු ගිණුමට බැර කර තිබූ නමුත් එය මුදල් පොතේ සටහන් කර නොමැත.

(4) 2024 ජනවාරි 30 දින නිකුත් කරන ලද රු.18,500/- ක චෙක්පතක් 2024 ජනවාරි 31 දින වන විටත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නොතිබුණි.

(5) 2024 ජනවාරි 29 දින රු.9,000/- ක චෙක්පතක් බැංකුවේ තැන්පත් කරන ලද නමුත් එය 2024 ජනවාරි 31 දින වන විටත් උපලබ්ධි වී නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත). (ලකුණු 03)

(b) 2024 ජනවාරි 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය. (ලකුණු 02)
(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

**නිම්සර ෆර්නිචර්, නිම්සර** ට අයිතිව ඇති කේවලස්වාමි ව්‍යාපාරයක් වන අතර, 2024 මාර්තු 31 දිනට **නිම්සර ෆර්නිචර්** හි ශේෂ පිරික්සුම පහත පරිදි වේ:

**නිම්සර ෆර්නිචර්**

**2024 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| විස්තරය | හර | බැර |
|---|---|---|
| පිරියත සහ උපකරණ - පිරිවැයට: | | |
| කාර්යාල උපකරණ | 8,000 | |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 2,500 | |
| මෝටර් රථය | 2,000 | |
| 2023 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| කාර්යාල උපකරණ | | 2,000 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | | 1,250 |
| මෝටර් රථය | | 500 |
| විකුණුම් | | 77,500 |
| ගැනුම් | 46,300 | |
| 2023 අප්‍රේල් 01 දිනට තොගය | 7,900 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 2,250 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 3,250 |
| බැංකුවේ ඇති මුදල් | 1,000 | |
| අතැති මුදල් | 70 | |
| බැංකු ණය මුදල | | 500 |
| වැටුප් සහ වේතන | 12,800 | |
| රක්ෂණය | 240 | |
| ආරක්ෂක ගාස්තු | 800 | |
| විදුලිය | 2,250 | |
| විකුණුම් කොමිස් | 900 | |
| ගෙවූ කාර්යාල කුලිය | 2,600 | |
| 2023 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | | 4,610 |
| **එකතුව** | **89,610** | **89,610** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2024 මාර්තු 31 දිනට අවසාන තොගය රු.5,200,000/- ක පිරිවැයට අගය කරන ලදී.

(2) 2024 මාර්තු මාසය සඳහා වූ රු.32,000/- ක විදුලි බිල, 2024 මාර්තු 31 දින වන විටත් ගෙවා නොමැත.

(3) 2024 ජනවාරි 01 දින, **ABC බැංකුවෙන්** රු.500,000/- ක බැංකු ණයක් ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා ලබාගෙන ඇති අතර, මාසිකව රු.15,000/- ක පොලියක් ගෙවීමට සහ ලබාගත් ණය මුදල මාස 12 ක් තුළ සම්පූර්ණයෙන් ගෙවා නිමකිරීමට එකඟ වී තිබේ. **නිම්සර**, 2024 ජනවාරි සිට 2024 මාර්තු දක්වා එකඟ වූ පොලිය හෝ ප්‍රාග්ධනය හෝ කිසිවක් ගෙවා නොමැත.

(4) ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ පහත සඳහන් පරිදි, පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමයි:

| | | |
|---|---|---|
| කාර්යාල උපකරණ | : | වර්ෂයකට 20% බැගින් |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | : | වර්ෂයකට 20% බැගින් |
| මෝටර් රථය | : | වර්ෂයකට 25% බැගින් |

(5) 2023 සැප්තැම්බර් 01 දින කාර්යාලය සඳහා කුලී ගිවිසුමකට එළඹුණු අතර, ගිවිසුම් කාලය අවසානයේ එනම් වසර 2 කට පසු ව්‍යාපාරයට ආපසු ගෙවන අත්තිකාරම් (key money) වශයෙන් මාස 6 ක කුලිය ද ගෙවන ලදී. මාසික කුලිය රු.200,000/- ක් වේ.

(6) දිගුකාලයක් තිස්සේ හිඟව ඇති ණයගැතියෙකුගේ රු.50,000/- ක ශේෂය, බොල් ණයක් ලෙස ලියා හැරීමටත්, 2024 මාර්තු 31 දිනට ඇති ඉතිරි ලැබිය යුතු මුදල් මත 5% ක අඩමාන ණය සඳහා ප්‍රතිපාදනයක් සිදු කිරීමටත් **නිම්සර**, තීරණය කළේය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 12)

(b) 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 08)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

## කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |